සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සිංහල - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න. පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) "... දරුවින් වදන්ට මා ඔබ ගිය මැනවැයි සමුණන්ට යාඥා කළෝය. උඉ ඒ අසා 'කුමක් කියන නියාද? මුඹ දුවණියන් හෙයින් මුඹට කියන කරන දෙයක් නැතත් මා අයති හෙයින් කළ අපරාධ තරමට මරවාපියන සේක, මා ඔබ යන්ට බැරිය'යි කීය. සිටු දුවණියෝ තවත් තවත් කියාත් උන් මැළි හෙයින් උන් කර්මාන්තයට ගිය දී ඉක්බිති ගෙවල ඇත්තවුන්ට 'ඉදින් අවුත් මා නොදැක විචාළෝ නම් දෙමව්පියන්ගේ ඔබ මා ගිය නියාව කියාලුව මැනවැ'යි කියලා ගෙයි දොර පියා නික්මුණාවු ය."

(1) සමුණන්ට යාඥා කළේ කුමක් සඳහා ද?

(2) 'කළ අපරාධ තරමට' යන්නෙන් කියැවෙන අපරාධ මොනවාද?

(3) ගෙයි දොර පියා නික්මුණේ කොහිද?

(4) **'සමුණන්ට' 'මා ඔබ යන්ට'** අර්ථ ලියන්න. (ලකුණු 04)

(ආ) "තෙල පෙනෙන දුම ඒ ය' යි කිවූය. උඉ ඒ වේලෙහි ශෝකය බලවත් ව සැලී පෙළෙන්නෝ තමන් හන් පිළී හෙන නියාවත් නොදැන උමතු බවට පැමිණ 'දරු දෙන්නත් මළෝ ය, සමුණෝත් මළෝ ය, මුඹ රැකෙන්ට අවුත් මව්පිය දෙදෙනාත් බෑණෝත් එක සෝනේ පවතී' යි හඬමින් වලපමින් හුණු පිළිත් අඳිනට නැති හෙයින් වියරුහුණු එකෙකැයි කියාගෙන කසළත් පසුත් හැර ගෙන හිස ඕනෝ කැට කැබිලිති බාලා ගසති.

(1) 'තෙල පෙනෙන දුම' යන්නෙන් කුමක් පිළිබඳව කියැවේද?

(2) එකසොනේ පවතින්නේ කවුරුන්ද?

(3) මිනිසුන් කැට කැබලිතිවලින් ගැසුයේ ඇයි?

(4) **'හුණු පිළීත්' 'හිස ඕනෝ'** අර්ථ ලියන්න. (ලකුණු 04)

(ඉ) "තුන් වන දවස් සුත් පැන් මෙන් කෙළවර වයස් වූ සත් සැට සියය දක්වා මෙ අතුරෙත් මියෙති. එහෙයින් උපන් සතුන්ට මරණ නියතය'යි සිත සිතා හුන්දැය. බුදුහු ගඳ කිළියේ වැඩහිඳ ම රස් කඳක් විහිදුවාලා ළඟ වැඩ හිඳ කතා කරන්නාක් මෙන් 'ඔම්බා පටාචාරාවෙනි, යම් කෙනෙක් රූ අරූ පස්කඳින් අවිද්‍යා ප්‍රත්‍යයෙන් රූ උපද්දී, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් රූ උපද්දී, කර්ම ප්‍රත්‍යයෙන් රූ උපද්දී, ආහාර ප්‍රත්‍යයෙන් රූ උපද්දී, උත්පත්ති ලක්ෂණය නම්...."

(1) කෙළවර වයස ලෙස මෙහි සඳහන් වයස් සීමාව කුමක්ද?

(2) බුදුහු වැඩ සිටියෝ කොහිද?

(3) **'රූ අරූ පස්කඳින්'** යන්නෙහි අර්ථය ලියන්න.

(4) 'එම්බා' යන්නෙහි ව්‍යාකරණ විග්‍රහය දක්වන්න. (ලකුණු 04)

(ඊ) "ඉඳුදුනු පැහැ දිනූ තුනු සිරිනූ දුල මමිතුර
ළඳ සොඳ අදර වැනි තගෙ තෙල තුඩ දුටුව
ලොබ බැඳ අදර නොකෙරති කවුරු සතුටුව
වන වනපති තුරෙහි පුර පුරපතින් මැඳුරෙහි
නඳව නිතොර ලැබ පිය පියකර පහස
රඳව පවර කෙළි කෙළ කෙළ හැම දවස"

(1) ඉඳු දුනු පැහැය ජය ගත්තේ කුමක් ද?

(2) මෙහි ගිරා තුඩ හෙවත් හොට කුමකට උපමා කර ඇත්ද?

(3) පුර මැඳුරුවලදී ගිරවා ලබන්නේ කුමක්ද?

(4) 'රඳව' 'කෙළ කෙළ' යන පදවල ව්‍යාකරණ විභාග දක්වන්න. (ලකුණු 04)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(1) "එසේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි."

(2) "මාගේ ශරීරයෙහි මරාටු පරඬලා කුරු කුහුඹු කයළ ලූහ."

(3) "අද මාගේ මනදොළ මුදුන් පැමිණෙන්නේ වනැ."

(4) "අපට අලුත් යාළුවෙක් හම්බ වුණා."

(5) "තෙල වියරුහුණු තැනැත්තිය මෙයට වැද්ද නොදෙව."

(6) "ඔය ළමයෙක් ඇරලා නූල්බෝලෙකුයි, කහ කැල්ලකුයි ගෙන්නන්න." (ලකුණු $2 \times 4 = 08$)

(ඌ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

ඔබ දෙදණ නිල් උඳුපියළි බිම මත
වැන්දේය ඔහු බැති සිතින්
අම්මා වැළලූ තැන මහ පොළොවට,
පිපිලා තිබුණා එතැන සුදු පාටට
නමක් නොමැති පුංචි මලක්
සිම්බේය ඔහු එමල නමා හිස

දස මසක් කුස තුළෙහි දරා සිට
මා ලොවට වැදූ අම්මා ඔබ ය.
කෙළවරක් නොමැති දුක් දරා විඳ
මා ලොවට හැදූ අම්මා ඔබ ය.

අඬන විට මා කුඩා අවධියෙහි බඩගිනි ව
තම්බා බතල දලු
ලුණු දියර ඉස
පොල් ගා මුසු කොට කවා
බඩගිනි නිවූ අම්මා ඔබ ය.

උයා උදයෙන් නැගිට කඩයප්පන්
තබා තේ කඩයෙහි
ලබා ඉන් ලැබෙන සුළු වට්ටම
ජංගි ඇන්දූ අම්මා ඔබ ය.

ගල්වා ඉසෙහි තෙල් යහමින්
එල්ලා කරෙහි පංචායුදය
අල්ලා ගෙන අතින් මා
පාසලට එක්ක ගිය
අකුරු නූගත් අම්මා ඔබ ය.

ඇවිද ලඳු දෙණි කැලෑ බිම්වල
රැගෙන විත් තුන්හිරිය පන් කොළ
යොදා කුකුල් සායම් රතු හා කොළ
වියා නෙක් විසිතුරු රටා පැදුරු
රටාවක් බව මේ මහා විශ්වය
කුඩා කල සිට ම මට
කියා දුන් අම්මා ඔබ ය.

නොදත්තෙමි මම එකල
අම්මේ ඔබ වත කැටපතක් බව
මෙකල මා සිත පිළිබිඹු කරන
ගිලී යට ගිය ඇස් කුහර තුළ
නොදුටුවෙමි කිසිවිටක සතුටක්
නොදුටුවෙමි කිසිවිටෙක දුකකුත්.

ඉවසා සම සිතින් සැම සැප දුක්
ලැබුවාද ඔබ සිතෙහි සාමයක් ?
ඉපයූවෙමි මම මුදල්
ඉපයුවෙමි කිතු යසස්
වීය මන්දිර යාන වාහන.
එහෙත් ඒ කිසිවකිනුත්
නොලදිමි සිත් සැනසුමක්.
වටහාගෙන සිටියාද ඔබ ඒ සත්‍යය
නොලබා ම ඔබ ඒ කිසිවක් ? (ලකුණු 16)

(02) 'දම්පියා අටුවාව' ඇසුරෙන් ලියැවුණ සද්ධර්මරත්නාවලිය, ධර්මසේන හිමියන්ගේ ප්‍රතිභාසම්පන්න රචනා කෞශල්‍යයෙන් බිහි වූ ස්වතන්ත්‍ර නිර්මාණයකි.' සනිදර්ශන ව විමසන්න. (ලකුණු 15)

(03) 'දන්දීමේ ආනිසංස මහත් බව විවරණය කිරීම සඳහා සද්ධර්මාලංකාර කතුවරයා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇත්දැ'යි ඔබ උගත් කතා ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)

(04) 'ගිරා සන්දේශකරුගේ වර්ණනා චාතුර්යය වඩාත් උද්දීපනය වන්නේ දූත වර්ණනයෙනි.' සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(05) 'පුද්ගලයා තුළ නිලීන ව පවත්නා සහජ ගති ලක්ෂණ කුමන හෝ අවස්ථාවක ඉස්මතු වේ.' ඔබ උගත් 'පුරුද්ද' කෙටිකතාව ඇසුරෙන් උක්ත කියමන විමසීමට ලක් කරන්න. (ලකුණු 15)

(06) කොළඹ යුගයේ කවීන්ගේ කාව්‍ය නිර්මාණයන්ට වස්තුවිෂය වූයේ ජාතික නිදහස, සමාජශෝධනය හා ස්වභාව සෞන්දර්යයි. ඔබ උගත් පද්‍ය පන්ති ඇසුරෙන් නිදසුන් දක්වමින් පහදන්න. (ලකුණු 15)

The National e-Learning Portal for The General Education